සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**09 ශ්‍රේණිය** | **තෙවන වාර පරීක්ෂණය - 2024** | **21 S I,II**

නම: ............................................ | **සිංහල භාෂාව හා සාහිත්‍යය** | **කාලය පැය දෙකයි**

## I කොටස

- **මෙම කොටසේ 1 - 20 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. වෙනත් අක්ෂරයක උපකාරයකින් තොරව තනිව උච්චාරණය කළ හැකි අක්ෂර හඳුන්වන නම,
    1. ගත කුරු ය. 2. ස්වර ය. 3. ව්‍යඤ්ජන ය. 4. මහාප්‍රාණ ය.

02. 'ක' වර්ගයේ අකුරක් හා 'ට' වර්ගයේ අකුරක් ඇතුළත් වචනය දී ඇති වචන අතුරින් තෝරන්න.
    1. තද 2. ගත 3. කඩ 4. මට

අංක 3 - 6 දක්වා ප්‍රශ්නවල ඉරි ඇඳි වචනය කුමන වියරණ වර්ගයට අයත් වේද?

03. <u>කෙනෙක්</u> සතුටින් ඔල්වරසන් දෙති.
    1. නිත්‍ය බහුවචන පද 2. අනියමාර්ථ පද
    3. ගෞරවාර්ථ බහුවචන උක්ත පද 4. ගෞරවාර්ථ බහුවචන අනුක්ත පද

04. ගුරුවරයා පිට්ටනියේ සිටි <u>සිසුන්</u> පන්තියට කැඳවයි.
    1. උක්ත පදයකි. 2. කර්තෘ පදයකි. 3. කර්ම පදයකි. 4. නිපාත පදයකි.

05. අප ප්‍රශංසා <u>කරද්දී</u> ඔවුහු සතුටු වූහ.
    1. ප්‍රයෝජ්‍ය ක්‍රියා 2. අසම්භාව්‍ය ක්‍රියා 3. විධි ක්‍රියා 4. නිපාත පදයකි.

06. <u>ඔවුහු</u> නිරතුරුව අසරණයන් වෙත දයාව දක්වති.
    1. ප්‍රථම පුරුෂ බහුවචන පදයකි. 2. උත්තම පුරුෂ බහුවචන පදයකි.
    3. මධ්‍යම පුරුෂ බහුවචන පදයකි. 4. ප්‍රථම පුරුෂ අනුක්ත බහුවචන පදයකි.

07. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.
    1. ඛනිජ, ලේඛණය, පරිගණකය 2. දෙරන, පිළිමය, විශිෂ්ඨ
    3. ශ්‍රේෂ්ඨ, ශිෂ්ඨාචාරය, සමස්ථ 4. වර්තමාන, වර්ධනය, මර්දනය

- **සාම්ප්‍රදායික යෙදුම් පිළිබඳ දැනුම ඇසුරෙන් 8 හා 9 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

08. <u>වැල්වටාරම්</u> නැතිව සිදු වූ දෙය කියන්න යැයි විදුහල්පතිතුමා ශිෂ්‍ය නායකයාට පැවසුවේ ය. ඉරි ඇඳි යෙදුමේ අදහස
    1. බොරු වර්ණනා 2. නිදසුන් 3. අනවශ්‍ය විස්තර 4. ප්‍රමාද නොවී

09. පහත ප්‍රස්තාව පිරුළුවල හිස්තැන් සම්පූර්ණ කරන්න.
    1. ..................................... අව්යෙන් ම නසිති.
    2. පය බරවායට ...................................... බෙහෙත් බැන්දා වගේ.

10. පහත වාක්‍යවල ඇතැම් විරාම ලකුණු යොදා නැත. එම විරාම ලකුණු යොදන්න.
    1. ගෝඨාභය රජු ක්‍රි.ව. 253 266 රටේ ආර්ථික සමෘද්ධිය ඇති කළේය.
    2. ඔබ කිය වූ දිට්හදාන කෙටි කතාව ජේ. සී. එස්. සිරිවර්ධන මහතා විසින් රචනා කරන ලදී.

11. ව්‍යාපාරික ලිපියක ඇතුළත් <u>නොවන</u> අංගය ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. ආමන්ත්‍රණය, දිනය 2. අත්සන, ලබන්නාගේ ලිපිනය
    3. ප්‍රාර්ථනය, දිනය 4. යවන්නාගේ නම, මාතෘකාව

• 12 - 13 වාක්‍යවල හිස්තැන්වලට සුදුසු වචන වරහන් තුළින් තෝරා ලියන්න.

12. 1. මිනිසුන් විසින් .................................... ආරක්ෂා කරනු ලබති. (සත්තු / සතුන්)

2. ක්‍රීඩකයන් විසින් තරගය ජයග්‍රහණය .................................... (කරන ලදි./ කරන ලද්දෝය./ කරයි.)

13. 1. අහස් යානා සමූහය අහසේ විසිතුරු රටා .................................... (මවති./ මවයි./ මවනු ලැබේ.)

2. .................................... හොඳින් ශිල්ප උගනිති. (පුතුන්/ පුතණුවෝ)

14. ගැළපෙන විශේෂණ පදය යොදන්න.

.................................... සෙබළා රට දැය වෙනුවෙන් සටන් කිරීමට .................................... ඉදිරිපත් වෙයි.

15. දී ඇති පද සඳහා බහ්වර්ථ පද දෙක බැගින් ලියන්න.

1. සත - .................................... , ....................................

2. දද - .................................... , .................................... (1/2x4=2)

16. පහත වාක්‍යයේ සුදුසු නිපාත පද ලියා හිස්තැන් පුරවන්න.

අධික වර්ෂාව .................................... ගඟේ වතුර පාලමේ ගෑවෙන .................................... පිරී ඇත.

17. කාලාර්ථය ප්‍රකාශ වන නිපාත පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. මෙන්, සේ, විලස
2. ඊයේ, නිතර, යළි
3. හෝ, නොහොත්, හෙවත්
4. ඇයි, කෙසේද, කීයටද

18. පහත වාක්‍යාංශ සඳහා තනිපද ලියන්න.

1. පා සතරක් ඇත්තේ - ....................................................................

2. තමා පිළිබඳ ඇති කරගන්නා ගෞරවය - ....................................................................

19. පහත පදවලට සමානාර්ථ පදයක් හා විරුද්ධාර්ථ පදයක් ලියන්න.

| | | සමානාර්ථ | විරුද්ධාර්ථ |
|---|---|---|---|
| 1. නූතන | - | .................................... | .................................... |
| 2. පෙරදිග | - | .................................... | .................................... |

20. පහත කවියේ අවසාන කවි පදය සම්පූර්ණ කරන්න.

කරුණා මහිම කොයි තරමද කිවොත් ඔබේ
මැවුණා මහා ගංගාවල් ලෙසින් ඉබේ
ඉනුණා බසින දියරක් තැවරුණොත් මොබේ
....................................................................................................

(ලකුණු 40)

## II කොටස

**ප්‍රශ්න අංක 01, 02, 03, 04, යන ප්‍රශ්නවලට හා 05, 06 ප්‍රශ්න දෙකෙන් (02න්) එකකට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

I. කොයි වැඳිරි ද කැමති නැත්තේ
ලා ගෙන පට දුහුල් වස්ත්‍ර
විලවුන් ගල්වා සුවඳැති
බොහොම රුවට පෙනී ඉන්ට?
(අ) ඉහත කොටස ඇතුළත් නාට්‍යයේ නම කුමක් ද?
(ආ) එම නාට්‍යය රචනා කළ කතුවරයාගේ වෙනත් නාට්‍ය කෘති දෙකක් නම් කරන්න.

II. සිංහල හා සංස්කෘත භාෂාවන්ගෙන් රචිත උපදේශ ග්‍රන්ථ එක බැගින් ලියන්න.
(අ) සිංහල - ....................................
(ආ) සංස්කෘත - ....................................

III. පහත දැක්වෙන ළමා පද්‍ය ග්‍රන්ථ රචනා කළ කතුවරුන් නම් කරන්න.
(අ) ළදරු ගී - ....................................
(ආ) හාවාගේ වග - ....................................

IV. ජනකතාව ආශ්‍රිත ව අසා ඇති පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(අ) ජනකතාව අයත් වන සාහිත්‍ය අංගය නම් කරන්න.
(ආ) ඩී. ජී. වික්‍රමසිංහ මහතා ජනකතාව පාදක කොට ගෙන රචනා කළ කෘතිය කුමක් ද?

V. කවි සමයේ දී
(අ) යමක් ඇති සැටියෙන් හඳුන්වන්නේ .................................... යන නමිනි.
(ආ) ඇති තතු ඉක්මවා දැක්වීම .................................... නමින් හැඳින්වේ.

(ලකුණු 2x5=10)

02. පහත සඳහන් මඟ පෙන්වන ලද ජේද අතුරින් එකක් තෝරාගෙන වචන 200කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.

I. නූතන සමාජයේ පවතින අපරාධ, අසාධාරණකම් හා ව්‍යසන සඳහා ප්‍රධාන වශයෙන් බලපාන්නේ ස ා ර ධ ර් ම පිරිහීම යි. සමාජයක ප්‍රගමනයට හේතු වන්නේ එහි වෙසෙන්නන් තුළ පවතින යහපත් ගුණාංග යි. සමාජයක ජීවත් වන අපට ඒ සමාජයේ පැවැත්මට හේතු වන චර්යා අනුගමනය කරන්නට සිදුවෙයි. මෙම කරුණු සැලකිල්ලට ගෙන ''යහපත් සමාජයක් උදෙසා සාරධර්ම'' යන මැයෙන් රචනාවක් ලියන්න.

II. කෘෂි කර්මාන්තය අප රටේ අතීතයේ සිට ම පවතින ප්‍රධාන ජීවන ක්‍රමය යි. රටක ආහාර අවශ්‍යතා සපුරා ගත හැක්කේ කෘෂිකර්මාන්තය නංවාලීමෙනි. මේ සඳහා රජයේ මැදිහත්වීම ද අවශ්‍ය වේ. කෘෂිකර්මාන්තය දියුණු කිරීම මඟින් රටේ ආර්ථික සංවර්ධනයට දායක විය හැකිය. මෙම කරුණු සැලකිල්ලට ගෙන 'කෘෂිකර්මාන්තය දියුණු කරමු'' මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.

III. ඈත කඳු මිටියාවත් මීදුමෙන් වැසී ඇත. සිසිල් සුළඟ ගත සිත පුබුදුවාලයි. විසිතුරු මලින් සැරසුණු පරිසරය චමත්කාරජනක ය. කඳු මිටියාවත්වල වගා කර ඇති විවිධ භෝග වර්ගවලින් පරිසර සුන්දරත්වය වැඩි කරයි. කඳු මුදුන් මතින් ගලා හැලෙන රිදීවන් දිය දහරා සිහින් හඬ නංවමින් ගලා බසියි. මෙම කරුණු සැලකිල්ලට ගෙන ''සුන්දර නුවරඑළිය'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

IV. 'දවල් වෙලා ඉස්කෝලේ යන්න නැඟිටින් නැද්ද?' අම්මාගේ හඬින් මම තිගැස්සී ඇහැරුණෙමි. එහෙත් පාසල් යාමට මට හිත හදා ගත නොහැක. පෙර දින ගුරුතුමිය ලබාදුන් ගෙදර වැඩ කිසිවක් කිරීමට නොහැකි විය. මට අසනීපයක්වත් වෙනවා නම්. අම්මාට බොරු කීමට ද මගේ හිත දෙන්නේ නැත. අන්තිමට මම අදිමදි කරමින් පාසල් යාමට ගෙදරින් පිටත් වුණෙමි. මෙතැන් සිට කතාව ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(ලකුණු 20යි.)

පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

03. පෙළ පොතේ ඇතුළත් පාඩම් ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. ''දැන් අපට පක්ෂ නෑ. මේ රටේ කිසි කෙනෙක්, ටික කලක් හිටන් මට ඒක තේරුණා.''
(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් විසින් ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද?

II. පෙර දැක නොමැති මුත් සුන්දරහාමි විසින් - මගෙ තොරතුරු ඇසූ සැටි හිතවතකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින් - පිළිගැන්වීය මට සොම්නස පිරුණු ඇසින්

(අ) මෙම කවියෙන් පැවසෙන වැදගත් සාරධර්මය කුමක් ද?

(ආ) නෙත්, සන්තුෂ්ටිය යන අර්ථ සඳහා කවියා භාවිත කර ඇති වචන තෝරා ලියන්න.

III. ''පුතා අයියනායක දෙවියංගේ පිහිටෙන් ගිහින් වරෙන්''

(අ) මෙසේ ප්‍රකාශ කළේ කවරෙක්ද?

(ආ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවර ස්ථානයකදී ද?

IV. මල්වල සුමිහිරි පැණි
ඇද බොන බඹරා මෙනි
හොඳ ළමයා නුවණිනි
හොඳ දේ තෝරා ගනී

(අ) ඉහත පද්‍යයේ සඳහන් උපමාව, උපමේය වෙන් කර දක්වන්න.

(ආ) ළමයාට හොඳ දේ තෝරා ගැනීමට මඟ පෙන්වන්නේ කුමක් ද?

V. ''හොඳයි කවුරුවත් මට උදව් වෙන්න එපා. මගේ කාරිය තනියම කරන්ට පුළුවනි.

(අ) මෙම ප්‍රකාශය කරන තැනැත්තාගේ නම කුමක් ද?

(ආ) මෙම තැනැත්තාට පැවරී ඇති කාර්ය සඳහන් කරන්න.

04. ඔබ පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීමේ අදහසින් පොත් ප්‍රදර්ශනයක් හා අලෙවි සැලක් පැවැත්වීමට පාසලේ සාහිත්‍යය සංගමය තීරණය කර ඇත. මේ සඳහා දායකත්වය ලබා දෙන ලෙස දන්වමින් ''උදාර'' පොත් ප්‍රකාශක ආයතනයේ කළමණාකරු වෙත යැවීමට සුදුසු ව්‍යාපාරික ලිපිය ලියන්න. ඔබ, සාහිත්‍ය සමිතියේ ලේකම් යැයි සිතන්න.

(ලකුණු 10 යි.)

05. පහත සඳහන් ඡේදය වචන 40-45 අතර වන සේ සාරාංශ කර ලියන්න.

දින ගණනාවකින් දිය පොදක් නොදුටු පිපාසිත උකුස්සකු ඉහළ අහසේ පියාසර කළේ දිය පොදක් තිබෙන තැනක් සෝදිසි කරමින් ය. එසේ පියාසර කරද්දී උකුස්සාගේ ඇස එක්වර ම ඇඳී ගියේ පහළ ඉන්ද්‍රනීල මාණික්‍යයක් සේ නිල් පැහැයෙන් දිදුලන දියෙන් පිරුණු, පස්පියුමෙන් බැබළි මහා ජලාශයක් දෙස ය. උකුස්සාගේ සිතට විශාල සතුටක් දැනිණ. වැර වීරිය යොදා පහළට ඊයක වේගයෙන් තටු සලන උකුස්සාට එකවර ම ඒ නිල් දිය දහර නොපෙනී ගියේ ය. හිම මෙන් සුදු පැහැති වලාවකින් තම ගමන් මඟ ඇහිරී ඇති බව දැනගත් උකුස්සාට තදබල වෙහෙසක් දැනුණේය. කොපමණ වේගයෙන් පහළට ඒමට උත්සහ දැරුවත් එය ව්‍යර්ථ වන බවක් ඌට හැඟී ගියේ එක්වර ම පැමිණි මහා සුළඟකින් තමාව ගසා ගෙන යන බව සිතට මෙන් ම ගතට ද දැනුණු විට ය. ඒ වන විට ධෛර්යය සිඳී ගොස් ය. සුළඟේ වේගය ද පැයට කි. මී. 80 කි. ඒ සුළඟින් උකුස්සා ඈතට ගසා ගෙන ගියේ ය.

06. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

අතීත දේශ ගවේෂකයන් විසින් සමුදුරු තරණය කිරීමේ දී තම ගමන් මාර්ගය සොයා ගැනීම, ගොඩ බිම ආසන්නයට පැමිණ ඇති බව දැන ගැනීම ආදිය සඳහා භාවිත වූයේ ලිහිණියන්ගේ ගැවසීම අධ්‍යයනය තරු රටා නිරීක්ෂණය ආදී ඉතා සරල ක්‍රමවේද වුවත් වෙළෙඳාම සඳහා විවිධ කටයුතු උදෙසා සිදු වුණු නාවික ගමනාගමනය ක්‍රමයෙන් වර්ධනය වීමේ දී රාත්‍රී කාලයට මුහුදු ගමන් බහුල වූ බැවින් නැව්වලට මඟ පෙන්වීම සඳහා ප්‍රදීපාගාර ස්ථාපනය කෙරිණි. ප්‍රදීපාගාරයක් යනු සමුද්‍රාසන්නයේ පවතින විශාල උස් පහන් කණුවක්, ලෙස සරලව හැඳින්විය හැකි අතර රාත්‍රිය පුරා නියමිත කාලයකට වතාවක් කරකැවෙන, ඉතා ඈතට ආලෝකය විහිදුවන පහනක් සෑම ප්‍රදීපාගාරයක ම සවි කර තිබේ. ලොව පුරා මේ වන විට ප්‍රදීපාගාර 186,000 ක් පමණ පිහිටා ඇති බව වාර්තා වන අතර ශ්‍රී ලංකාවේ ප්‍රදීපාගාර 26ක් පමණ දක්නට ලැබේ. ලංකාව කුඩා රටක් වුව ද ද්වීපයක් වීම නිසාත් ලෝකයේ ප්‍රධාන ම මුහුදු මාර්ගවලට මායිම් ව පිහිටීම නිසාත් මෙසේ රට පුරා ම ප්‍රදීපාගාර පිහිටා ඇත.

1. අතීත දේශ ගවේෂකයන් සමුදුරු තරණයේ දී, ගොඩබිම ආසන්නයට පැමිණ ඇති බව දැන ගත්තේ කෙසේ ද?
2. ප්‍රදීපාගාර ස්ථාපනයට බල පෑ හේතු ලියන්න.
3. ප්‍රදීපාගාරයක ඇති විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.
4. ශ්‍රී ලංකාවේ ප්‍රදීපාගාර වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තේ ඇයි?
5. පහත සඳහන් වචනවල අර්ථ ලියන්න.

නිරීක්ෂණය
ස්ථාපනය

(ලකුණු 2x5=10)